සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved.



**B**

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# නාට්‍ය හා රංගකලාව - II

**13 ශ්‍රේණිය**

**කාලය පැය 02 යි.**

- **A හා B කොටස්වලින් ප්‍රශ්න 02 බැගින් තෝරාගෙන ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.**

## A කොටස

01 (01) ප්‍රාසාංගික කලාවේ විශේෂණ පැහැදිලි කරන්න.

(02) ප්‍රාසාංගික කලා නම් කොට එයින් 02 ක් පිළිබඳ විමර්ශනය කරන්න.

(03) ප්‍රාසාංගික කලා අතර නාට්‍ය දරණ සුවිශේෂීත්වය පිළිබඳව පැහැදිලි කරන්න. (ලකුණු 15)

02 (01) සොකරි නාට්‍යයේ පුරාවෘත්තය කෙටියෙන් පහදන්න.

(02) සොකරි නාට්‍යයේ පූජාර්ථ අරමුණු පැහැදිලි කරන්න.

(03) කෝලම් නාට්‍යයේ විශේෂතා පහදන්න (ලකුණු 15)

03 (01) ඇන්ටිගනී නාට්‍යයේ ගැටුම් අවස්ථා කෙටියෙන් පහදන්න.

(02) එම ගැටුම් අවස්ථා නාට්‍යය ඛේදජනකයක් කරා ගෙන යන අයුරු පහදන්න.

(03) සොෆොක්ලීස් එම නාට්‍ය මගින් දීමට අපේක්ෂා කළ අරමුණු සඵල වීද? ඔබේ අදහස් දක්වන්න (ලකුණු 15)

## B කොටස

04 (01) 'සුභ සහ යස ' නාට්‍යය කැපීපෙනෙන්නේ කවර හේතූන් නිසාදැයි පහදන්න.

(02) එම නාට්‍යය මගින් ඉදිරිපත් කෙරෙන විවරණය සැකෙවින් දක්වන්න

(03) සුභ සහ යස නාට්‍යයට ප්‍රේක්ෂක ප්‍රතිචාර ලැබී ඇති අයුරු පහදන්න. (ලකුණු 15)

05 (01) ''අභිඥාන ශාකුංතලයට'' අදාළ මූලාශ්‍රය ලියන්න.

(02) එයට කාලිදාස සිදුකර ඇති වෙනස්කම් මොනවාද?

(03) සංස්කෘත නාට්‍යයේ කතා විකාශනය හා බැඳුණු ප්‍රධාන අවස්ථා නිදසුන් මගින් පහදන්න. (ලකුණු 15)

06 (01) ''කැතාසිස්කරණය'' සංකල්පය පහදන්න.

(02) ග්‍රීක ට්‍රැජඩියක මූලිකාංග හඳුන්වන්න.

(03) ග්‍රීක ට්‍රැජඩියක කතා නායකයා මුහුණ දෙන විවිධ ඛේදනීය තත්වයන් පිළිබඳ ඔබ උගත් නාට්‍යයක් ඇසුරෙන් පහදන්න. (ලකුණු 15)

( මුළු ලකුණු 4x 15 = 60 )

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved.



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

**13 ශ්‍රේණිය** | **නාට්‍ය හා රංගකලාව** | **පිළිතුරු පත්‍රය**

## I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. (2) | 02. (2) | 03. (1) | 04. (1) | 05. (4) | 06. (1) | 07. (1) | 08. (3) | 09. (9) | 10. (2) |
| 11. (1) | 12. (2) | 13. (3) | 14. (4) | 15. (1) | 16. (1) | 17. (2) | 18. (3) | 19. (3) | 20. (4) |
| 21. (2) | 22. (3) | 23. (3) | 24. (2) | 25. (5) | 26. (5) | 27. (5) | 28. (2) | 29. (2) | 30. (3) |
| 31. (4) | 32. (2) | 33. (4) | 34. (3) | 35. (5) | 36. (5) | 37. (4) | 38. (4) | 39. (1) | 40. (1) |

(ලකුණු 40)

## II කොටස

01. (1) සජීවී බව, සතර අභිනය භාවිතය, ඒ මොහොතේදී පමණක් පැවරීම, ඍජු ප්‍රේක්ෂක සහභාගීත්වය හා ප්‍රතිචාර ලැබීම, අනුශාංගික කලා සියල්ල ම භාවිතය, නළු නිළියන් විසින් ඉදිරිපත් කිරීම. (ල. 4)

(2) නර්තනය, සංගීතය, මුද්‍රා නාට්‍ය. ඔපෙරා , බැලේ , නාට්‍ය වැනි ප්‍රාසාංගික කලා 02 ක් නම් කොට ඒවායෙහි විශේෂතා දක්වා තිබීම. (ල. 5)

(3) සජීවී බව, සතර අභිනය, වේදිකාවක් මත ඉදිරිපත් කිරීම, අනුශාංගික කලා භාවිතය, ප්‍රේක්ෂක ප්‍රතිචාර ඒ වෙලෙහිම ලැබීම ........යනාදි කරුණු දක්වා තිබීම. (ල. 6)

02. (1) පුරා වෘත්තය කෙටියෙන් දක්වා තිබිම.

(2) පහන් පැලක් තිබිම. පූජාර්ථ කවි ගායනා, නළුවන් රංගනයට පෙර පේවීම.

(3) වෙස් මුහුණු පැළඳීම. නාට්‍ය ධර්මී රංග ශෛලිය යොදා ගැනීම, කාරියකරවන රාළ පාත්‍රයින් හඳුන්වාදීම හා කථා වස්තුව ඉදිරිපත් කිරිම. නිභ්චිත ආකාතියක් පැවතීම, තානායම්පොළ රංගස්ථානයක් යක් ලෙස යොදාගැනීම. පිරිමින් රඟපෑම. (ල. 15)

03. (1) ඇන්ටිගනී තම සොහොයුරිය වන ඉස්මෙන් හා ඇතිවන ගැටුම, හේවායන් හා ක්‍රියෝන් අතර ගැටුම , ටෛරේසියස් පූජකතුමා හා ක්‍රියෝන් අතර ගැටුම. ( නිදසුන් සපයමින් විස්තර කිරීම)

(2) ඉහත ගැටුම් අවස්ථා විස්තරකොට ඛේදාන්තයක් දක්වා ගෙන යාමට හේතුවන අයුරු පහදන්න.

(3) ප්‍රධාන කතා නායකයා නායිකාව තමාගේ ස්ථාවරත්‍වයේ රැඳී සිටීම. මොවුන්ගේ සිතුවිලි ඇන්ටිගනී නාටය ඛේදාන්තයක් කරා ගෙන යාමට හේතු වෙයි. (ල. 15)

04. (1) ඓතිහාසික සිදුවීමක් පදනම් කොටගෙන තිබීම.නාට්‍ය ශෛලීන් දෙකම යොදා ගැනීම, විශිෂ්ට චරිත නිරූපණය, සංවාද භාවිතය , නාට්‍යමය ගුණය. අවස්ථා නිරූපණය ආදිය මගින් පිළිතුරු සනාථ කිරීම.

(2) සමාජ, ආර්ථික, දේශපාලන විවරණය කරයි. පවතින පාලනතන්ත්‍ර ප්‍රතික්ෂේප කිරීම,
අයිතිවාසිකම් පිළිබඳ ආකල්ප ආදිය පෞද්ගලික අරමුණු හේතුවෙන් අසාර්ථකත්වය ආදිය මත පිළිතුරු ගොඩනැගීම.

(3) මාක්ස්, ලෙනින්, වාදය විනිවිද දකිය හැකි අයුරින් නාට්‍ය නිර්මාණය, නව අර්ථකථනයක් සැපයිම, සියුම් මනෝභාවික තත්ත්වය නිරූපණය, කිරීම, හාස්‍යය උපහාසය තාත්විකබව, අනන්‍යතාවය පිළිබඳ ගැටුම, ඓතිහාසික සිදුවීම් පෙළක් ඔස්සේ අමාත්‍ය මණ්ඩලයේ ක්‍රියාකලාපය, විදග්ධ භාෂාමය හැකියාව, නාට්‍යයෝචිත බව, උත්සාහය, අවස්ථානෝචිතව ව්‍යාංගාර්ථ දෙබස් ආදිය මගින් පිළිතුර සනාථ කිරීම

(ල. 15)

05. (1) මූලාශ්‍රය කෙටියෙන් දැක්වීම.

(2) මහා භාරත කථාව හා කාලිදාස එයට කර ඇති වෙනස්කම් මෙහි දී බලාපෙරොත්තුවෙයි. කාලිදාස කර ඇති වෙනස්කම් අතර , චරිත ගණන වැඩිකර ඇත. නාට්‍යයෝචිතබව, ආදිය මගින් පිළිතුරු සනාථ කිරීම.

(3) ආරම්භ, යත්න ප්‍රාප්ත්‍යාශා නියතාප්ති ඵලාගම නිදසුන් මගින් විස්තර කරන්න. (ල. 15)

06. (1) භාව ශෝධනය , භය හා කරුණ හේතුවෙන් ප්‍රේක්ෂකයා තුළ වූ භාව සමනය කිරිම.

(2) කතා වස්තුව, වාග් විලාසය, චින්තනය, චරිත නිරූපණය , සංගීතය , ප්‍රේක්ෂක විස්තර කිරීම.

(3) පිළිතුර සනාථ කිරිම මත ලකුණු ලබා දෙන්න. ( ලඃ 15)

( මුළු ලකුණු 4 x 15 = 60)

| | | |
|---|---|---|
| 1 | පළමු පත්‍රය | 40 |
| 11 | පත්‍රය | 60 |
| | | 100 |